**සීමාසහිත ලංකා සිමෙන්ති පීඑල්සී සමාගම - 2016**
**-------------------------------------------------------------**

සීමාසහිත ලංකා සිමෙන්ති පීඑල්සී සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**
**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**---------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**2.1 මතය ව්‍යාචනය**
**-----------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

සමාගම 1984 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා (2008 හැර) අලාභ ලබා තිබුණු අතර, 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.628,478,493 ක් හා රු.634,157,397 ක් වූ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතුණි. තවද පසුගිය යුධමය වාතාවරණය තුළ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව මුළුමනින්ම විනාශ වී තිබූ අතර, සමාගමේ කාර්යභාරය සිමෙන්ති මළු ආනයනය කර විකිණීමට පමණක් සීමා වී තිබුණි. පවතින තත්ත්වය තුළ 2016 වර්ෂයේදී රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සේවකයින්ට වන්දි ගෙවා ඉවත් කර සමාගමේ රාජ්‍ය හිමිකාරත්වය මුළුමනින්ම නිදහස් කර ගැනීමට 2016 ඔක්තෝබර් 20 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යෝජනා ඉදිරිපත් කර තිබුණි. මේ අනුව ඉහත කරුණු සමාගමේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

සමාලෝචිත වර්ෂයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාවේ යකඩ විකිණීමෙන් ලැබූ රු.20,000,000 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී එය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්ත ශාලාව වසර ගණනකට පෙර විනාශ වී තිබීම හේතුවෙන් දැනට පවත්නා වටිනාකම සත්‍යාපනය කිරීමෙන් තොරව කර්මාන්තශාලාවේ වත්කම් ලෙස පෙර පැවති (රු.229,957,152 ක) වටිනාකම දක්වා ඒ මත ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ අගය රු.156,255 ක් වූ කාර්යාල උපකරණ සඳහා ක්ෂය ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම්වලට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | විලම්භිත ප්‍රදාන | 74,197,970 | ප්‍රදානයන්ට අදාළ ලිපි |
| (ii) | දේපල, පිරියත හා උපකරණ | 229,957,152 | ස්ථාවර වත්කම් ලේඛන, භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (iii) | වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් | 11,210,170 | ශේෂ සනාථන ලිපි සහ ණය ලිපිගොණු. |
| (iv) | වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් | 40,433,807 | ශේෂ සනාථන ලිපි සහ ණය ලිපිගොනු |
| (v) | සිමෙන්ති තොගය | 3,188,671 | භෞතික සමීක්ෂණ වාර්තා |
| (vi) | දිගුකාලීන ගෙවිය යුතු මුදල් | 757,223,883 | ශේෂ සනාථන හා අදාළ ණය ලියවිලි. |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.11,810,170 ක් වූ අතර, එම ශේෂයෙන් වසර 1 සිට වසර 3 දක්වා රු.1,434,486 ක් ද වසර 3 ඉක්ම වූ රු.10,375,684 ක ශේෂයක්ද විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු.61,908,116 ක් වූ අතර, එම ශේෂයෙන් වසර 1 ට වඩා අඩු රු.17,652,150 ක් ද වසර 1 සිට වසර 3 දක්වා රු.10,665,998 ක් ද වසර 3 ඉක්මවූ රු.33,589,968 ක ශේෂයක්ද විය. මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 7 දරන සමාගම් පනත 133(1) වගන්තියේ (ඒ) සහ (බී) | ගිණුම් වර්ෂය අවසන්වී මාස 06 ක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස් හිමියන් සඳහා වාර්ෂික මහසභා රැස්වීම් පැවැත්විය යුතු වුවත්, 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාර්ෂික මහසභා රැස්වීම් එපරිදි පවත්වා නොතිබූ අතර, 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාර්ෂික මහසභා රැස්වීම් පවත්වා නොතිබුණි. |

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 4.2.6 වගන්තිය | කාර්යසාධන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර, කාර්තුව අවසන් වී දින 30 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සහ මහා භාණ්ඩාගාරය වෙත, ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 5.1 වගන්තිය | සංයුක්ත සැලැස්ම යථාර්තවාදී සහ අත්පත් කරගත හැකි විය යුතු වුවත්, සමාගම විසින් 2016 – 2021 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කර තිබුණු සැලැස්මේ ඇතුළත් සිමෙන්ති ආනයනයන් පිළිබඳ සංඛ්‍යා අනුව 2016 වර්ෂයේදී මෙට්‍රික් ටොන් 300,000 ක් ආනයනය කිරීමට ඉලක්ක කර තිබුණද සත්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 8,260 ක් විය. |
| (iii) | 5.1.3 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත්, යාවත්කාලීන කළ වාර්ෂික අයවැය ලේඛනය සමග රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (iv) | 9.3.1(vi) හා (vii) වගන්තිය | චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූල නොවන ලෙස තනතුරු 02 ක් සඳහා මාස 03 ක කාල සීමාව ඉක්මවා වැඩ බැලීමේ පත්වීම් 02 ක් ලබාදී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.74,738,644 ක් වූ ගොඩනැගිලි හා වාහන සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.5,678,904 ක අලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු. 8,048,091 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,369,187 කින් වර්ධනය වී තිබුණි. පරිපාලන වියදම් හා බෙදාහැරීමේ වියදම් පිළිවෙලින් රු.8,772,736 කින් හා රු.4,336,630 කින් ඉහළ ගියද වෙනත් ආදායම් රු.18,794,381 කින් ඉහළ යාම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1981 සැප්තැම්බර් 03 දිනැති අංක පීබීඑස් 1123 දරන සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සමාගම ආරම්භ කිරීමේ අරමුණු ලෙස සිමෙන්ති ආනයනය, නිෂ්පාදනය, විකිණීම, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම, ආයෝජන කටයුතු සිදු කිරීම, නියෝජිත කටයුතු සිදු කිරීම හා වත්කම් වැඩි දියුණු කිරීම ඇතුළුව අරමුණු 33 ක් සඳහන් කර තිබුණි.

එම අරමුණු ඉටු කර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය වන විට සමාගම සිමෙන්ති ආනයනය කර විකිණීමේ කාර්යය පමණක් ඉටු කරමින් පැවති අතර, සමාගම පිහිටුවීමේදී සමාගම මඟින් ඉටු කිරීමට අපේක්ෂා කළ සෙසු අරමුණු කිසිවක් ඉටු කිරීම කෙරෙහි සමාගමේ කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂය තුළදී සමාගම විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 8,260 ක් ආනයනය කර තිබුණු අතර ඒ සඳහා සමාගම රු.75,708,623 ක පිරිවැයක් දරා තිබුණි. වර්ෂය තුළදී සමාගම සිමෙන්ති මෙට්‍රික් ටොන් 8,260 ම අලෙවි කර තිබුණු අතර, එයින් රු.110,587,354 ක ආදායමක් උපයාගෙන තිබුණි. සමාගමේ මුළු විකුණුම් පිරිවැය රු.107,201,864 ක් වීම නිසා රු.3,385,490 ක දළ ලාභයක් පමණක් වර්ෂය තුළදී උපයාගෙන තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2016 ඔක්තෝබර් 20 දිනැති අංක PE/RES/VRS – 1 – 2016 දරන ලිපිය ප්‍රකාරව, සමාගම විසින් කන්කසන්තුරේ ඉඩම සිමෙන්ති සංස්ථාව වෙත පවරා, සංස්ථාව සතු සියයට 62.45 ක කොටස් හා රජය සතු සියයට 12.82 ක කොටස්, කොටස් වෙළඳපොලේ විකුණා රජයට ආදායම ලබාදී සමාගමේ යෝජිත නව සංයුක්ත සැලැස්ම සුදුසු පරිදි ක්‍රියාත්මක කර, එහි ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය වෙත දැන්විය යුතු වුවත්, අදාළ යෝජනා ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 වර්ෂය තුළදී සමාගම ප්‍රතිව්‍යුහගතකරණය කර තිබූ අතර, ඒ වන විට සේවය කරමින් සිටි කාර්ය මණ්ඩලය ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ 2016 ජූලි 31 දින සේවයෙන් ඉවත් වී තිබුණි. අනතුරුව අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් මත කොන්ත්‍රාත් පදනම යටතේ තෘතීය මට්ටමේ සේවකයින් තිදෙනෙකු බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගමේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත්කර තිබුණේ 2017 ජූලි 07 දිනදීය.

**5.2** **අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාගම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකවී නොතිබූ අතර, අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | | **නිරීක්ෂණ** |
|---|---|---|
| (අ) ගිණුම්කරණ හා මූල්‍ය පාලනය | | විධිමත් මූල්‍ය පාලන ක්‍රම හඳුන්වා නොදීම, බදු සහ ණය වැනි අත්‍යාවශ්‍ය ගෙවීම් සිදු නොකිරීම, මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් වාර්තා කිරීමේදී ගිණුම්කරණය/පාලන ගිණුම් හා සැසඳීම් පිළිබඳ විධිමත් ක්‍රමයක් සමාගම විසින් පවත්වා නොතිබූ බැවින් ඒවායේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පරීක්ෂා කිරීමට නොහැකි වීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම, සමීක්ෂණ මණ්ඩල පත් කර වත්කම් සමීක්ෂණය නොකිරීම සහ කර්මාන්තශාලාව ඇතුළු වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම. |
| (ඇ) ණයගැති හා ණයහිමි පාලනය | | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට පියවර නොගැනීම සහ ඒ පිළිබඳ වාර්තා ක්‍රමානුකූලව සහ විස්තරාත්මකව පවත්වා නොගැනීම. |
| (ඇ) මෙහෙයුම් පාලනය | (i) | සමාගම 2016 ජූලි මාසයේ ප්‍රතිව්‍යුහගතකරණයත් සමඟ අභ්‍යන්තර විගණක ඇතුළු කාර්ය මණ්ඩලය ඉවත්වී යාමෙන් පසු අභ්‍යන්තර පාලන ක්‍රම දුර්වල මට්ටමක පැවතීම, අභ්‍යන්තර විගණන අංශයක් නොමැති වීම. |
| | (ii) | රජයේ බදු නීති රීති වලට අනුකූලව වාර්තා පවත්වා නොගැනීම සහ නිසි පරිදි බදු ගෙවීමට ක්‍රියා නොකිරීම. |